විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ සම්මේලනය
Federation of Expatriate Sri Lankans

2020/09/02 දින

අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා,
ජනාධිපති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය,
ජනාධිපති ලේකම් කාර්යාලය ,
කොළඹ 01, ශ්‍රී ලංකාව.

අතිගරු ජනාධිපතිතුමනි,

**<u>13A ව්‍යවස්ථා සංශෝධනය, ACSA/SOFA සහ MCC ගිවිසුම් සම්බන්ධයෙනි</u>**

සැමවිටම ජාතිකවාදී අවශ්‍යතා රැකගනිමින්, රට නැවත ගොඩනැගීමට හා ඉදිරියට ගෙනයාමට අත්‍යාවශ්‍ය ප්‍රතිපත්ති රාමුවක් සැකසීම සඳහා, මෑතකදී අවසන් වූ මහා මැතිවරණයෙන් ප්‍රමාණවත් බහුතරයක් ලබාගැනීමට ඔබතුමා සහ අගමැතිතුමා ලබාදුන් නායකත්වයට විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ සංගමයේ සාමාජිකයන් වන අපගේ හෘදයාංගම සුබපැතුම් පිරිනමන්නෙමු.

ඔබතුමන් ජනාධිපති ධූරයට පත්කිරීම වෙනුවෙන් හා මෑතකදී පවත්වන ලද මැතිවරණය වෙනුවෙන් වසර පහක් පුරා වෙහෙස නොබලා ක්‍රියාකළ විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ සම්මේලනයේ සාමාජිකයන් වන අප, පහත සඳහන් ජාතික හා උපායමාර්ගික වශයෙන් වැදගත් වන යෝජනා ඔබ වෙත ඉදිරිපත් කිරීමට කැමැත්තෙමු.

## 1. 13 වන සංශෝධනය

හමුදාමය වශයෙන් බලවත් අපගේ අසල්වැසි ඉන්දියාවේ මැදිහත්වීම මත 1987 වසරේදී අප ව්‍යවස්ථාවලියට ඇතුළු වූ මෙම 13 වන සංශෝධනය, පවත්නා පාලන ක්‍රමය සංශෝධනය කොට, බලය බෙදාහැරීමේ බලතල රාශියක් සහිත පළාත් සභා පිහිටුවීමට අපහට බල කරනු ලැබීය. මෙය ස්වදේශික ජනතාවට අවම ප්‍රතිලාභ ගෙනදෙන අනවශ්‍ය බාධාවක් ලෙස ඔප්පු වී ඇත. ආර්ථික පිරිවැයට අමතරව, රට දෙකඩ වීමට තුඩුදෙන බෙදුම්වාදී දේශපාලනය සිදුකරගෙන යාමට ඉවහල් වන මෙම සංශෝධනය, වෙනම රාජ්‍යක් පිහිටුවීමට අපේක්ෂා කරන ජාතිවාදී පුද්ගල කණ්ඩායම් අතට පත්කරනු ලබන ආයුධයක් හා සමාන වනු ඇත.

මහජනතාවගේම බදු මුදල් පසුම්බියෙන් වැටුප් ලබා ඔවුන්ට අවම සේවයක් පමණක් ඉටුකරනා තවත් අනවශ්‍ය දේශපාලඥයන්ගෙන් සමන්විත පරිපාලන ක්ෂේත්‍රයක්

ගෙනවීම සදහා, අත්හිටවූ පළාත් සභා මැතිවරණ නොපැවැත්විය යුතු බවට අප තරයේ සිතන්නෙමු. වර්තමාන රජයේ ප්‍රථම හය මස තුළ, ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාව සංශෝධනය කර 13A සංශෝධනය අවලංගු කිරීමට පාර්ලිමේන්තු බහුතරය යොදාගත යුතු බවත්, පළාත් සභා වෙනුවට, බලය පවරා දුන් බහු-දිස්ත්‍රික් සභා වැනි ක්‍රියාකාරී විකල්පයක් පිහිටුවිය යුතු බව අපගේ අදහසයි.

මෙම ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට යම් කාලයක් ගතවේ යයි අපේක්ෂා කරන්නේ නම්, බලය පවරා ඇති ඉඩම් හා පොලීසි බලතල වලට අදාළ හානිකර වගන්ති සහ ශ්‍රී ලංකාවේ වෙනම රාජ්‍යක් බිහිකිරීමේ අරමුණින් යුතුව, ෆෙඩරල්වාදයේ ස්වරූපයෙන් පාර්ලිමේන්තු බල කේන්ද්‍රය සමග පවත්නා තම සබදතා බිදහෙළීමට පෙලඹිය හැකි විශාල ප්‍රාදේශීය සභා, පළාත් ඒකාබද්ධ කිරීම හා ස්ථාපිත කිරීම සදහා පළාත් දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයකට ප්‍රතිපාදන සැකසීම සිදුකල හැකි හානිකර වගන්ති කිහිපයක් වහාම ක්‍රියාත්මක වන පරිදි ඉවත්කිරීමට කටයුතු කලයුතුය යන්න අපගේ අපේක්ෂාවයි.

## 2. ACSA/SOFA හා MCC ගිවිසුම්

ඇමෙරිකා එක්සත් ජනපදය සමග එළඹ ඇති ඉහත සදහන් ගිවිසුම් ත්‍රිත්වය සම්බන්ධයෙන් ජාතික ස්වෛරීත්වයට හා ආරක්ෂාවට ඇතිවී තිබෙන තර්ජනය අවම කරගැනීම සදහා පහත සදහන් පියවර ගතයුතු බව, අප යෝජනා කරන්නෙමු.
පොදු මහජනතාවට පහසුවෙන් ලබාගත නොහැකි, වඩාත් සවිස්තරාත්මක තොරතුරු ඇතුලත් ACSA ගිවිසුමකට පසුගිය රජය ඇතුල්වී ඇති බව අප දනිමු. 2017 වසරේදී අත්සන් කරන ලද එම සම්පූර්ණ පැකේජයම බලධාරීන් විසින් සමාලෝචනය කොට එය ශ්‍රී ලංකාවට අහිතකර යැයි පෙනී ගියහොත් අවසන් කිරීමේ නොතීසියක් ලබදෙන ලෙසත්, පසුව අවශ්‍ය වන්නේ නම් අපගේ ප්‍රධාන වෙළෙද හවුල්කරුවකු වන ඇමෙරිකා එක්සත් ජනපදය සමග යහපත් සම්බන්ධතාවක් පවත්වාගැනීම උදෙසා වඩාත් සමබර නව විධිවිධානයන් කතිකා කරගන්නා ලෙසත් අප යෝජනා කර සිටිමු.

එක්සත් ජනපද මිලිටරි හා කොන්ත්‍රාත් නිලධාරීන්ට රාජ්‍ය දූත නිර්මුක්තියෙන් අවි ආයුධ දරා මෙරටට ඇතුළුවීමට හා දිවයින තුල සිදුකරන සියලු ක්‍රියාවන් ඇමෙරිකා එක්සත් ජනපදයේ නීති රීතීන්ට යටත්ව සිදුකිරීමට අවසර ලබාදෙන SOFA ගිවිසුමට අප ඇතුළු නොවිය යුතුය.

මෙම විෂයට අදාල සමාලෝචනයක් සදහා ජනාධිපතිතුමන් විසින් මෑතකදී පත්කරන ලද ආචාර්ය ලලිතසිරි ගුණරුවන් කොමිෂමේ සාමාජිකයන් නිර්දේශ කර ඇති පරිදි MCC ගිවිසුම සංශෝධනය නොකර ඉදිරියට නොගෙන යා යුතුයි.

විදේශීය රජයන් හා නියෝජිතායතන සමග ඇතිකරගන්නා මෙම ගිවිසුම්, පළමු පියවරක් ලෙස රට තුල විවෘතව සාකච්ඡා කල යුතුය. මේ සදහා අදාළ සියලු ලේඛනයන් ජාතික භාෂාවන් වලට පරිවර්තනය කල යුතුය. එම ගිවිසුම් වලට එලඹීමට පෙර, අදාළ සියලු අංශයන්හි නෛතික සමාලෝචනයන් සිදුකොට ඒවා ව්‍යවස්ථාදයකයේදී සාකච්ඡා කල යුතුය.

**3. 30/1 UNHRC යෝජනාවට අනුකූලව සම්මත කරන ලද සියලු පනත් අහෝසි කිරීම හා ස්ථාපිත කෙරුණු සංවිධාන සංශෝධනය කිරීම.**


30/1 UNHRC – 'යහපාලන' රජයේ යෝජනාව පිළිගැනීම රජය විසින් නැවතත් ප්‍රතික්ෂේප කල යුතුය.

අතුරුදන් වූවන්ගේ කාර්යාලයේ සභාපතිවරයාට හා එහි නියෝජිතයන්ට අධික බලතල ලබාදී ඇත්නම්, ඒ පිළිබදව හා අතුරුදන් වූවන් සම්බන්ධයෙන් නිශ්චිත නිර්ණය කිරීමක් හා වන්දි ගැටළු සම්බන්ධයෙන් සමාලෝචනයක් සිදු කල යුතුය.
පනතෙන් හෝ පරිපාලනමය අධිකරියකින් අවසර දී ඇත්නම් ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාව සමහ සටන් වැද මරණයට හෝ අනතුරට පත් හිටපු එල්.ටී.ටී.ඊ සටන්කරුවන්ට යම් වන්දි මුදලක් ලැබීමට ඇත්නම් එම වන්දි ලබාදීමේ පදනම විමර්ශනය කල යුතුය.

**4. වත්මන් මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම.**

වත්මන් දිස්ත්‍රික් මනාප ක්‍රමයෙන්, ඡන්ද කොට්ඨාශය අනුව මන්ත්‍රීවරුන් පත්කරන, සරලවූ බහුතර ක්‍රමයකට (first past the post) මාරු වියයුතුය. අදාළ පක්ෂයන් හට ලැබී ඇති ප්‍රකාශ කරන ලද මුළු ඡන්ද ප්‍රමාණයෙන් ජාතික ලැයිස්තුවට වෙන්කර ඇති ප්‍රසාද හා අමතර ආසන වලට, කැපීපෙනෙන බුද්ධියක් ඇති, ශිල්පීය කුසලතා සහිත හෝ ප්‍රජාවට ස්වේච්ඡා සේවාවන් කල ඇති සුදුසු පුද්ගලයන් හට පාර්ලිමේන්තුව තුල සිට රට දැයට සේවය කිරීමට අවස්ථාව සලසා දීම සිදුකල යුතුය.

මෙම යෝජනා සදහා ඔබතුමන්ගෙන් යහපත් ප්‍රතිචාරයක් ලැබීමට අප බලාපොරොත්තු වෙමු.



ආචාර්ය දසරත් ජයසූරිය
විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ සම්මේලනයේ සභාපති වෙනුවෙන්

පිටපත් -:

අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා
අගමැති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය,
අරලියගහ මන්දිරය,
කොළඹ 03, ශ්‍රී ලංකාව.

අති පූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සුමංගල මහානායක හිමි,
ශ්‍යාමෝපාලි මහානිකාය, මල්වතු පාර්ශ්වය.
අතිපූජ්‍ය වරකාගොඩ ශ්‍රී ඥානරතන මහානායක හිමි,
ශ්‍යාමෝපාලි මහානිකාය, අස්ගිරි පාර්ශ්වය.
අතිපූජ්‍ය ත්‍රිකුණාමලේ ආනන්ද මහානායක හිමි,
ශ්‍රී අමරපුර ධර්මරක්ෂිත නිකාය.
පූජ්‍ය බෙන්ගමුවේ නාලක හිමි
පූජ්‍ය ඇල්ලේ ගුණවංස හිමි
පූජ්‍ය මහාචාර්ය මැදගොඩ අභයතිස්ස හිමි
පූජ්‍ය මැදගම ධම්මානන්ද හිමි
පූජ්‍ය මාහාචාර්ය ඉදුරාගාරේ ධම්මරතන හිමි
පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමි
පූජ්‍ය උඩුදුම්බර කාශ්‍යප හිමි

ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා
ගරු විමල් වීරවංශ මැතිතුමා
ගරු උදය ගම්මන්පිල මැතිතුමා
ගරු රියර්. අද්මිරාල් ආචාර්ය සරත් වීරසේකර මැතිතුමා
ගරු ආචාර්ය අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමා
ගරු වෛද්‍ය මාහාචාර්ය චන්න ජයසුමන මැතිතුමා
ගරු ආචාර්ය නාලක ගොඩහේවා මැතිතුමා
ගරු ගෙවිදු කුමාරතුංග මැතිතුමා
ගරු අනුප පැස්කුවල් මැතිතුමා
ගරු වෛද්‍ය සීතා අරඹෙපොළ මැතිනිය
අනිල් අමරසේකර මහතා (ජාතික ඒකාබද්ධ කමිටුව)
ආචාර්ය ගුණදාස අමරසේකර මහතා
ජනාධිපති නීතිඥ මනෝහර දි සිල්වා මහතා
සියලු මාධ්‍ය ආයතන